නිපුණතාව 04 විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් නිර්මාණකරණයේ යෙදේ.

නිපුණතා මට්ටම 4.2 චරිතාත්ම අංග රචනය සඳහා ක්‍රමවේදයන් සහ චරිත ගොඩනැගීමේ ශිල්ප ක්‍රම අධ්‍යයනය කරමින් අංග රචනය කරයි.

ක්‍රියාකාරකම 4.2 චරිතාත්ම සඳහා අංග රචනය කරමු.

ඉගෙනුම් පල :

- අංග රචන ආලේපන ද්‍රව්‍ය නම් කරයි.
- අංග රචනයේ විවිධ ශිල්ප ක්‍රම හඳුන්වයි.
- චරිතාත්ම අංග රචනය යනු කුමක්දැයි විස්තර කරයි.
- ශාන්තිකර්මවල අන්තර්ගත ඇතැම් චරිත සඳහා නූතන අංග රචනය යොදා ගත හැකි බව ප්‍රදර්ශනය කරයි.
- වේදිකා නාට්‍යවලට උචිත චරිතයක් අංග රචනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.
- නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් අංග රචනය කරයි.

ශිෂයා කල යුතු කාර්යයන් -

- අංග රචනය පිළිබඳව අන්තර් ජාලය තුළි නරඹා මූලික දැණුමක් ලබා ගන්න.
- අංග රචනයේ ප්‍රභේධ පිළිබඳව වෙන වෙනම අවබෝධයක් ලබා ගන්න.
- අංග රචනය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය මොනවාදැයි හඳුනා ගන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක**

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය
- **සෞන්දර්ය අධ්‍යාපනයට අත්වැලක් - ජාතික අධ්‍යාපන ආයතනය**
- Youtube

ඇගයීම්

- ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි ශිල්ප ක්‍රම භාවිත කරන ආකාරය ඇගයීමට ලක් කිරීම අවශ්‍ය වේ.
- අංග රචනා ආලේපන ද්‍රව්‍ය නම් කරන්න.
- අංග රචනා ශිල්ප ක්‍රම දෙකක් විස්තර කරන්න.

**සඳහන් ඇගයීම් ද සිදු කරන්න.**

- සති පාසල් කාර්‍ය පත්‍රිකා - 12 නර්තනය පළමුවන වාරය A - 16

<u>පසු ක්‍රියාකාරකම්</u>

- අංග රචනය පිළිබඳව ලබා ගත දැනුම තව දුරටත් වර්ධනය කර ගන්න.
- පාසල් විවිධ ප්‍රසංගයකදී ඒ සඳහා සහභාගී වන ශිල්පීන් අංග රචනය කිරීමට උත්සහ ගන්න.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය . රත්නපුර කලාපය .**